# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment


| මගේ අංකය / எனது இல / My No | ඔබේ අංකය / உமது இல / Your No | දිනය / திகதி / Date |
|---|---|---|
| DSD/HO/04/LH/06/ NEMP -2025 | | 2025.06. 26 |

සමෘද්ධි චක්‍රලේඛ අංක 2025/07

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය /සහකාර අධ්‍යක්ෂවරුන්,
සියළුම සමෘද්ධි මූලස්ථාන ,බැංකු සමිති,ව්‍යාපෘති , ප්‍රජා මූල බැංකු කළමනාකරුවන්,
සියළුම සංවර්ධන නිලධාරීන්,
සියළුම සමෘද්ධි සංවර්ධන නිලධාරීන්.

## ප්‍රජා සවිබලගැන්වීමේ ජාතික වැඩසටහන ක්‍රියාත්මක කිරීම 2025

## අස්වැසුම ප්‍රතිලාභී පවුල් සවිබලගැන්වීම - ජීවනෝපාය සංවර්ධනය

**හැඳින්වීම** :- සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තු යටතේ ක්‍රියාත්මක වූ සමෘද්ධි සහනාධාර ලබාදීමේ වගකීම අස්වැසුම සුභසාධක මණ්ඩලය වෙත පැවරීමත් සමඟම 2023.04.17 හා 2024.09.25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අනුව එම පවුල් ඒකක පූර්ණ සවිබලගැන්වීමේ වගකීම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පවරා ඇත. ඒ අනුව දැනටමත් 2025.02.11 දිනැතිව නිකුත් කර ඇති සමෘද්ධි චක්‍රේලඛ අංක 2025/01 ඇමුණුම 1 අනුව කාණ්ඩ 4 ක් යටතේ වසමකින් පවුල් ඒකක 50 ක් තෝරා ගැනීමට උපදෙස් දී ඇත. ඒ සඳහා දැනටමත් සුබසාධන ප්‍රතිලාභ මණ්ඩලයෙන් ලබාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 25 ක අස්වැසුම ප්‍රතිලාභී නාම ලේඛනය දිස්ත්‍රික්කයට එක බැගින් වන ලෙස ඔබ වෙත ලබාදී ඇත. එම නාමලේඛන මත පදනම්ව තෝරාගනු ලබන අස්වැසුම ප්‍රතිලාභ පවුල් සවිබලගැන්වීම ඉලක්ක කර මෙම චක්‍රලේඛ උපදෙස් නිකුත් කෙරේ.2025 වර්ෂයේ භාණ්ඩාගාර ප්‍රතිපාදන ලෙස සීමිත ප්‍රමාණයක් ලැබී ඇති බැවින් එම අරමුදල් භාවිතා දුප්පත් හා අන්ත දුප්පත් යන කාණ්ඩ දෙකට අයත් පවුල් ඒකක වල ජීවනෝපාය ප්‍රවර්ධනය ඉලක්ක කර සුදුසු ජීවනෝපාය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාල උපදෙස් මෙහි අන්තර්ගත වේ.

**ප්‍රතිලාභී පවුල් හඳුනා ගැනීම**:- දැනටමත් සුබසාධන ප්‍රතිලාභ මණ්ඩලය මගින් ලබාගෙන ඔබ වෙත ලබාදී ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වසම් වල අස්වැසුම ප්‍රතිලාභී ලේඛන පදනම් කරගෙන සමෘද්ධි චක්‍ර ලේඛ අංක 2025/1 ඇමුණුම 01 අනුව අංක 1,2 හා 3 කාණ්ඩ යටතේ පවුල් 38 ක් තෝරාගැනීමට කටයුතු කළ යුතුය. ඉන් පසු එම පවුල් වල මූලික තොරතුරු ඇමුණුම 01 අනුව සම්පූර්ණ කිරීම අවශ්‍ය වේ.

මෙම චක්‍රලේඛය මගින් ආවරණය වන්නේ එම හඳුනා ගන්නා පවුල් අතරින් දුප්පත් හා අන්ත දුප්පත් යන කාණ්ඩ දෙකට අයත් පවුල් පමණි. ව්‍යාපෘති සඳහා එම පවුල් තෝරා ගැනීමේ දි ද අස්වැසුම ප්‍රතිලාභී පවුල් ප්‍රජා සවිබලගැන්වීමේ වැඩසටහනට හඳුනා ගැනීමේ දී ලබා දී ඇති නිර්නායක ඒ ආකාරයෙන්ම වලංගු වේ.




1වන අදියර,4 වන මහල , සෙත්සිරිපාය , බත්තරමුල්ල. / 1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல / 1st Step, 4 th floor, Sethsiripaya Battara

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director (Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2869824 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 28** |

**පවුල් සංවර්ධන සැලස්ම සකස් කිරීම හා ව්‍යාපෘති ජීවනෝපාය ව්‍යාපෘති හඳුනා ගැනීම:-** නව සවිබලගැන්වීමේ වැඩසටහන විධිමත් ක්‍රමවේදයක් අනුව ක්‍රියාත්මක වන බැවින් ජීවනෝපාය ව්‍යාපෘති හඳුනාගැනීම ද ක්‍රමානුකූලව සිදුකිරීමට සැලසුම් කර ඇත. තවද මෙම වැඩසටහන යටතේ හුදු ජීවනෝපාය ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමෙන් පමණක් පවුල් සවිබලගැන්වීමට අපේක්ෂා නොකරන අතර පවුල් ඒකකයක් මුහුණ දෙන සියලුම ආර්ථික, සමාජීය හා මානසික ගැටළු කෙරෙහි අවධානය යොමු කරනු ඇත. ඒ අනුව 2025.05 22 දිනැතිව සමෘද්ධි චක්‍ර ලේඛ අංක 2025/01 ට දෙවන එකතුව ලෙස යොමුකර ඇති චක්‍රලේඛයේ ඇමුණුම 01 අනුව පවුල් සංවර්ධන සැලස්ම සකස් කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. එම උපදෙස් අනුව පවුල් සංවර්ධන සැලස්ම සකස් කිරීමේ දී එහි පළමු ඉලක්කය ලෙස සටහන් කර ඇත්තේ එක් එක් පවුල් ඒකකය වෙත වඩාත්ම සුදුසු ජීවනෝපාය හෝ රැකියා අවස්ථාව හඳුනා ගැනීමයි. මෙම චක්‍ර ලේඛය මගින් පවුල් ඒකකයක් වෙත සුදුසු ජීවනෝපාය මාර්ගයක් හඳුනා ගැනීමට අවශ්‍ය උපදෙස් ලබාදෙන අතර කිසියම් පවුල් ඒකකයක් රැකියා අවස්ථාවක් සඳහා යොමු වීමට අපේක්ෂා කරන්නේ නම් ඊට අදාල උපදෙස් දැනටමත් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2025.06.04 දිනැතිව සමෘද්ධි චක්‍රලේඛ අංක 2025/5 අලෙවි සංවර්ධන වැඩසටහන නමින් නිකුත් කර ඇත. පවුල් සංවර්ධන සැලස්ම සකස් කිරීමේ දී ආර්ථික ඉලක්කය යටතේ එකට වඩා වැඩි ඉලක්කප්‍රමාණයක් හඳුනා ගත්තද ප්‍රමුඛතාවය අනුව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රජා සවිබලගැන්වීමේ වැඩසටහන යටතේ පහසුකම් සපයන්නේ එක් අවස්ථාවක් සඳහා පමණි.

පවුල් සංවර්ධන සැලස්ම සකස් කිරීමේ දී කිසියම් පවුල් ඒකකයක් දැනටමත් ප්‍රමාණවත් ආදායමක් ලබන්නේ නම් එම පවුල් ඒකකය වෙත ජීවනෝපාය ව්‍යාපෘතියක් හඳුන්වාදීමට වඩා අවධානය යොමු කළ යුත්තේ එම පවුල් ඒකකය මුහුණු දී ඇති අනෙකුත් සමාජීය හා මානසික ගැටළු හඳුනා ගනිමින් ඊට පිළියම් යෙදීම සඳහාය.

ජීවනෝපාය ව්‍යාපෘති හඳුනා ගැනීමේ දී දැනටමත් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින් සිදුකල වෙළඳපල විශ්ලේෂණය සහ විකල්ප ජීවනෝපාය අවස්ථා හඳුනා ගැනීම සම්බන්ධයෙන් සිදුකළ සම්පත් සිතියම සකස් කිරීමේ දී ඔබ දිස්ත්‍රික්කයට අදාල ඵලදායි ජීවනෝපාය ව්‍යාපෘති පිළිබඳව දළ අවබෝධයක් ඇතැයි විශ්වාස කරමි. අදාල ලේඛනය (ඇමුණුම 01) මගින් ඔබවෙත යොමු කරන එම ලේඛනයට අමතරව අඛණ්ඩව ඉලක්ක ආදායම ජනනය කළ හැකි වඩාත් සුදුසු ව්‍යාපෘති ඇත්නම් හඳුනා ගැනීමට අවස්ථාව ඇත.

එක් එක් පවුල් ඒකකය සඳහා සුදුසු ජීවනෝපාය ව්‍යාපෘතිය හඳුනා ගැනිමෙන් පසු එකී ව්‍යාපෘති සඳහා ව්‍යාපාර සංවර්ධන සැලස්මක් සකස් කළ යුතුය. එහි දි පවුල් ඒකකය සතු මානව හා භෞතික සම්පත් කෙරෙහි අවධානය යොමු කළ යුතුය. (ව්‍යාපාර සංවර්ධන සැලස්ම සකස් කිරීමට අදාල ආකෘතිය අමුණා ඇත. (ඇමුණුම 02 )

**ඉලක්ක කණ්ඩායම හඳුනා ගැනීම:-** දැනටමත් ඔබ දිස්ත්‍රික්කය සඳහා ලබාදී ඇති අස්වැසුම සුභසාධන ප්‍රතිලාභ මණ්ඩලයෙන් ලබාගත් ප්‍රතිලාභි ලේඛනයේ දූප්පත් හා අන්තදූප්පත් කාණ්ඩ දෙකට අයත් පවුල් අතරින් ඉලක්ක කණ්ඩායම තෝරාගැනීමට කටයුතු කළ යුතුය. එක් වසමකින් දූප්පත් හා අන්ත දූප්පත් යන කාණ්ඩ දෙකින් පවුල් 15 ක් තෝරා ගත්තද, මුළු පවුල් සංඛ්‍යාවටම මෙම ප්‍රතිපාදන යටතේ ජීවනෝපාය අධාර ලබාදීමේ හැකියාවක් නොමැත. (ඇමුණුම 3 ) ඒ අනුව ඔබ දිස්ත්‍රික්කය සඳහා ප්‍රතිපාදන ලබාදිය හැකි ව්‍යාපෘති ( ඇමුණුම් අංක 3 ආකෘතිය අනුව ) සඳහන් කර ඇත. ඒ අනුව දූප්පත් හා අන්ත දූප්පත් යන කාණ්ඩ දෙකින් වඩාත්ම සුදුසු පවුල් සංඛ්‍යාව තෝරාගැනීමට කාරුණිකවන්න.

**අරමුදල් සම්පාදනය:-** මෙම පවුල් ඒකක සඳහා හඳුනාගනු ලබන ජීවනෝපාය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට එක් පවුල් ඒකකයකට රුපියල් 50,000.00 ක සීමාවකට යටත්ව මුල්‍ය ප්‍රදානයක් ලබාදීමට ඉහත(ඇමුණුම 4 )ඇති ව්‍යාපෘති සංඛ්‍යාව මත පදනම්ව ප්‍රතිපාදන වෙන්කර ඇත. එම ප්‍රතිපාදන ලබාදිය හැක්කේ පවුල් සංවර්ධන සැලස්ම තුළින් හඳුනාගනු ලබන ජීවනෝපාය ව්‍යාපෘතිය සඳහා පමණි. එම මුල්‍ය සහාය ලබාදීමට පෙර ව්‍යාපෘතියට අවශ්‍ය ඔහු සතු භෞතික හා මානව ප්‍රාග්ධනය කෙරෙහි අවධානය යොමුකර ව්‍යාපාර සැලස්ම සකස් කල යුතුය. එම සැලස්මේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා පමණක් මෙම ප්‍රතිපාදන වැය කළ

යුතුය. එමෙන්ම ප්‍රතිලාභියා ජීවනෝපාය ප්‍රදානයන් භාවිතා කරන්නේ ව්‍යාපෘතියේ කුමන ආයිතමයන් සඳහා ද යන්න ව්‍යාපෘති වාර්තාවේ පැහැදිලිව සටහන් කළ යුතුය.

එමෙන්ම මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී දෙපාර්තමේන්තු දායකත්වයට 2% පරිපාලන වියදමක් ලබාදීමට කටයුතු කරන අතර, එම පරිපාලන වියදම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට 1% ක් ද දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා 0.5% ක් හා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ජීවනෝපාය සංවර්ධන අංශයේ පරිපාලන වියදම් ලෙස 0.5% ලෙස ද වෙන් කර ඇත. පරිපාලන ලබා ගත හැක්කේ වැය කරන මුදලට සාපේක්ෂවයි. පරිපාලන වියදම අමතරව ලබාදීමට කටයුතු කරනු ඇත.( ඔබ දිස්ත්‍රික්කය සඳහා අරමුදල් වෙන්වන ආකාරය ඇමුණුම 04 මගින් දක්වා ඇත.

**ව්‍යාපෘති අනුමත කිරීම හා ප්‍රතිලාභියාට අරමුදල් ලබාදීම:-** ප්‍රතිලාභියා හෝ ඔහුගේ පවුලේ සමාජිකයෙකු සඳහා හදුනාගනු ලබන ජීවනෝපාය ව්‍යාපෘතිය පදනම් කරගෙන අමුණා ඇති ව්‍යාපාර සැලස්ම සකස් කළ යුතුය. එම ව්‍යාපාර සැලස්යේ එක් එක් පියවරයන් සඳහා යෝජිත නිළධාරින් අත්සන් කිරීමෙන් පසු ප්‍රාදේශිය ලේකම් අනුමැතියෙන් පසු ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන ලබාදිය යුතුය.එක් ප්‍රතිලාභියෙකු සඳහා ලබාදිය හැකි රජයේ දායකත්වය රුපියල් 50,000.00 ලෙස සඳහන් කර තිබුණත් ලබාදිය හැකි මුළු ව්‍යාපෘති පිරිවැයෙන් 50% පමණි. ( උදාහරණයක් ලෙස රුපියල් 50,000 ක් ලබාදීමට හැකි වන්නේ ප්‍රතිලාභි දායකත්වය රුපියල් 50,000.00 ක් සමඟ ව්‍යාපෘති පිරිවැය ලක්ෂයක් වන අවස්ථාවක දී පමණි.) ව්‍යාපෘතිය අනුමත කිරීමෙන් පසු මුල්‍ය ප්‍රදානයට පෙර අමුණා ඇති ගිවිසුම ප්‍රතිලාභියා සමඟ අත්සන් කළ යුතුය.

**ගිවිසුම්ගත වීම** : රජයේ ප්‍රතිපාදන මගින් ලබා දෙන යෙදවුම් තම ව්‍යාපාරයේ කාර්යයන් සඳහා පමණක් යොදාගන්නා බවට අදාළ ප්‍රතිලාභියා, තම කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් සමඟ ඇමුණුම 06 පරිදි ගිවිසුම්ගත විය යුතුය.

**ප්‍රගතිය වාර්තා කිරීම :-** මෙම ව්‍යාපෘතියේ ප්‍රගතිය මාසිකව ලබාගැනීමට අපේක්ෂා කරන අතර ඒ සඳහා සුදුසු ක්‍රමවේදය ඉතා කඩිනමින් ඔබට දැනුවත් කිරීමට කටයුතු කරනු ඇත. එතෙක් එක් එක් ප්‍රතිලාභියාට අදාල ව්‍යාපාර සංවර්ධන සැලස්ම සකස් කිරීමෙන් පසු වසම් මට්ටමින් එහි සාරාංශයක් සකස් කර (ඇමුණුම 5) අනුව jeevonopaya@gmail.comවිද්‍යුත් ලිපිනයට ලබාදීම සඳහා ඔබගේ මූලස්ථාන කළමනාකරුට ලබාදීමට කාරුණිකවන්න.

**පොදු උපදෙස්**

01. මෙම වැඩසටහන සඳහා ප්‍රතිලාභීන් තෝරා ගැනීමට අවකාශ ඇත්තේ දැනට ඔබ දිස්ත්‍රික්කය සඳහා අස්වැසුම සුභසාධන ප්‍රතිලාභ මණ්ඩලයෙන් දත්ත ලබාගත් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ දුප්පත් හා අන්ත දුප්පත් පවුල් ඒකකවල සමාජිකයන් අතරිනි.

02. තෝරාගනු ලබන ව්‍යාපෘතිලාභීන් සියළුදෙනා ප්‍රජා මූල සංවිධාන සාමාජිකයන්ට ලබා තිබිය යුතුය.

03. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල මෙන්ම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල සහය සේවා පද්ධතියට අයත් අනෙකුත් නිලධාරින්ගේ සහය ලබාගැනීම අනිවාර්ය වේ.

04. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී රජයේ අනුමත ප්‍රසම්පාදන ක්‍රමවේදය, මුදල් රෙගුලාසි හා මෙම චක්‍රලේඛ උපදෙස් අනුගමනය කරමින් කටයුතු කල යුතු වේ.

05. ලබාදෙනු ලබන භාණ්ඩාගාර ප්‍රතිපාදන හා අග්‍රිම,2025.11.30 දිනටපෙර ව්‍යාපෘති සහ අනෙකුත් වැඩසටහන් සඳහා වැයකර අවසන් කල යුතුවේ.

06. වසමේ සමෘද්ධි සංවර්ධන නිලධාරි, සංවර්ධන නිලධාරී (Development Officer), ව්‍යාපෘති කළමනාකරු,ප්‍රජා මූල බැංකු කළමනාකරු හා ප්‍රජා මූල බැංකු සමිති කළමනාකරු එකතුවී කොට්ඨාශයේ ආරම්භ කරන ලද වැඩසටහන් සාර්ථකව නියමිත අරමුණු කරා ළඟා වීම පිළිබඳව

සාකච්ඡා කිරීම, ගැටළු විසදීම සඳහා අවශ්‍ය පියවර හා සම්බන්ධිකරණ කටයුතු , පසුවිපරම හා ප්‍රගතිය වාර්තා කිරීම කල යුතුය.

07. මෙහිදී ප්‍රජා මූල සංවිධාන, ප්‍රාදේශීය සංවිධාන නිලධාරීන් ද ව්‍යාපෘති අධීක්ෂණය සඳහා සක්‍රිය අයුරින් සහභාගී කරගත යුතු අතර, විනිවිදභාවය හා සමාජ විගණනයක් සඳහා අවශ්‍ය පරිසරයක් ඇති කල යුතු වේ.

08. ප්‍රගතිය අවශ්‍ය ඕනෑම විටෙක ප්‍රධාන කාර්යාලය වෙත ලබා දිය හැකි පරිදි සකස් කිරීමටත්, යාවත්කාලීන කිරීමටත් කටයුතු කල යුතු වේ. සෑම මසකම අවසන් දිනට සකස් කරන ලද මාසික ප්‍රගති වාර්තාව එළඹෙන මස 10 වන දිනට පෙරලබාදීමට කටයුතු කළ යුතුය. එම ප්‍රගතිය jeevonopaya@gmail.comහරහා පමණක්ජීවනෝපායසංවර්ධන අංශය වෙත ලැබීමට සැලැස්විය යුතුය.

09. සියළුම වැඩසටහන් සාර්ථක කරගැනීම සඳහා දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂවරුන් සහ සියළුම විෂය භාර නිළධාරීන්ගේ නිරන්තර අවධානය හා පසුවිපරම් කිරීම අත්‍යවශ්‍ය වනු ඇත.

10. ඉහත සියළු වැඩසටහන් සාර්ථක කරගැනීමට ඔබ ඇතුළු සියළු නිලධාරීන්ගේ කැපවීම අගය කොට සලකන අතර මේ පිළිබඳව වැඩිදුර විස්තර දූරකථන අංක 011-2873801 මගින් හෝ ජීවනෝපාය අංශයේ නිළධාරීගේ පුද්ගලික දූරකතන අංක වලට ඇමැතීමෙන් පැහැදිලි කර ගත හැකි බව කාරුණිකව දන්වමි.

.....................

පි.කේ.එස්.සුභෝදිනි
අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ)
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

පිටපත් :

1. ලේකම්, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යංශය - කා.දැ.ස
2. අතිරේක ලේකම් (ප්‍රජා සවිබල ගැන්වීම්), සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යංශය - කා.දැ.ස
3. සභාපති, සමෘද්ධි සංවර්ධන භාරකාර මණ්ඩලය - අ.ක.ස
4. අධ්‍යක්ෂ, සමාජ ආරක්ෂණ අංශය, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස
5. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව - කා.දැ.ස
6. විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය - කා.දැ.ස
7. අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ස හා අ.ක.ස
8. ප්‍රධාන ගණකාධිකාරී, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ස හා අ.ක.ස
9. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ස
10. සියළුම අංශ ප්‍රධානීන්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ස
11. මූලස්ථාන/සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති/ බැංකු කළමනාකරුවන්/ ව්‍යාපෘති කළමනාකරුවන්

| Microenterprise Livelihood Options | Minimum Requirements | ව්‍යාපාර මාර්ගය | අවම අවශ්‍යතා | நுண் நிறுவனம் | குறைந்தபட்ச தேவைகள் |
|---|---|---|---|---|---|
| Bakery Products | Reliable supply of electricity, Safe place for equipment, Clean kitchen area (Tile top benches) to produce bakery products hygienically; | බේකරි නිෂ්පාදන | විශ්වාසදායක අඛණ්ඩ විදුලි සැපයුමක්, උපකරණ සඳහා ආරක්ෂිත ස්ථානයක්, බේකරි නිෂ්පාදන සනීපාරක්ෂක ලෙස නිෂ්පාදනය කිරීම සඳහා පිරිසිදු මුළුතැන්ගෙයි ප්‍රදේශය, ටයිල් සවි කළ මේසය (Tile Top benches); | பேக்கரி பொருட்கள் | நம்பகமான மின்சாரம் வழங்கல், உபகரணங்களுக்கு பாதுகாப்பான இடம், பேக்கரி பொருட்களை சுகாதாரமாக உற்பத்தி செய்ய சுத்தமான சமையலறை பகுதி (டைல் டாப் பெஞ்சுகள்); |
| Banana Cultivation | At least 1/2 acre, Reliable supply of water, Fencing in the land or can be fenced | කෙසෙල් වගාව | අවම වශයෙන් අක්කර 1/2 ක්, විශ්වාසදායක අඛණ්ඩ ජල සැපයුමක්, ඉඩම තුළ වැට බැඳ හෝ වැට බැඳිය හැකිය. | வாழை பயிர்ச் செய்கை | குறைந்தபட்சம் 1/2 ஏக்கர் வேலியுடன் கூடிய காணி அல்லது வேலி அமைக்கப்படலாம், நம்பகமான நீர் வழங்கல், |
| Bee-honey Production | Vegetation and flowers in the surrounding, Reliable supply of water | මී පැණි නිෂ්පාදනය | අවට වෘක්ෂලතා සහ මල්, විශ්වාසදායක අඛණ්ඩ ජල සැපයුමක් | தேனீ /தேன் உற்பத்தி | சுற்றியுள்ள தாவரங்கள் மற்றும் பூக்கள், நம்பகமான நீர் வழங்கல். |
| Betel Production | At least ½ acre land, Reliable supply of water | බුලත් නිෂ්පාදනය | අවම වශයෙන් අක්කර ½ ක ඉඩමක්, අඛණ්ඩ ජල සැපයුමක් | வெற்றிலை பயிர்ச் செய்கை | குறைந்தது ½ ஏக்கர் நிலம், நம்பகமான நீர் வழங்கல். |
| Bite Production | Reliable supply of electricity, Safe place for equipment, Clean kitchen area (Tile top benches) to produce bite products hygienically, safe area for releasing used oil to the environment; | Bites නිෂ්පාදනය | විශ්වාසදායක අඛණ්ඩ විදුලි සැපයුමක්, උපකරණ සඳහා ආරක්ෂිත ස්ථානයක්, සනීපාරක්ෂාව සඳහා බයිට් නිෂ්පාදන නිෂ්පාදනය කිරීම සඳහා පිරිසිදු මුළුතැන්ගෙයි ප්‍රදේශය (ටයිල් සවි කළ මේසය), භාවිතා කළ තෙල් පරිසරයට මුදා හැරීම සඳහා ආරක්ෂිත ප්‍රදේශයක්; | தின்பண்ட உற்பத்தி | உபகரணங்களுக்கு பாதுகாப்பான இடம், உணவுப் பொருட்களை சுகாதாரமாக உற்பத்தி செய்ய சுத்தமான சமையலறை பகுதி (டைல் டாப் பெஞ்சுகள்), பயன்படுத்தப்பட்ட எண்ணெயை சுற்றுச்சூழலுக்கு |
| Brick Production | ½ acre land area to get soil / Access to get soil, Reliable supply of water, Access to firewood | ගඩොල් නිෂ්පාදනය | පස ලබා ගැනීමට අක්කර භාගයක භූමි ප්‍රමාණයක් / පස ලබා ගැනීමට ප්‍රවේශය, විශ්වාසදායක ජල සැපයුමක්, දර සඳහා ප්‍රවේශය. | செங்கல் உற்பத்தி | மண் பெற ½ ஏக்கர் நிலம், நம்பகமான நீர் வழங்கல், விறகு கிடைப்பது. மூலப் பொருளான மண்ணைப் பெறக்கூடியதாக இருத்தல் |
| Cassava cultivation | ½ acre land, Reliable supply of water for irrigation | මඤ්ඤොක්කා වගාව | අක්කර ½ ක ඉඩමක්, වාරිමාර්ග සඳහා විශ්වාසදායක ජල සැපයුමක් | மரவள்ளிக்கிழங்கு பயிர்ச் செய்கை | ½ ஏக்கர் நிலம், பாசனத்திற்கு நம்பகமான நீர் வழங்கல். |
| Dairy Farming | ¼ to ½ acres per farmer for growing CO3 grass per cow, Availability of veterinary service or vet surgeon's office should be nearby | කිරි නිෂ්පාදනය | එළදෙනෙකුට CO3 තණකොළ වගා කිරීම සඳහා ගොවියෙකුට අක්කර ¼ සිට ½ දක්වා, පශු වෛද්‍ය සේවාවක් හෝ පශු වෛද්‍ය කාර්යාලයක් ළඟම තිබිය යුතුය. | பால் பண்ணை | ஒரு விவசாயிக்கு ¼ முதல் ½ ஏக்கர் வரை CO3 புல்லை பசுவிற்கு வளர்ப்பதற்கு, கால்நடை சேவை அல்லது கால்நடை அறுவை சிகிச்சை நிபுணர் அலுவலகம் அருகிலேயே இருக்க வேண்டும். |
| Dairy Products (Curd, Yoghurt, Ghee, Cheese) | Reliable supply of electricity, Safe place for equipment, Clean kitchen area (Tile top benches) to produce dairy products hygienically, Reliable way to obtain 25-35 litres of fresh milk per day | කිරි නිෂ්පාදන (කිරි, යෝගට්, ගිතෙල්, චීස්) | විශ්වාසදායක අඛණ්ඩ විදුලි සැපයුමක්, උපකරණ සඳහා ආරක්ෂිත ස්ථානයක්, සනීපාරක්ෂාව සඳහා කිරි ආශ්‍රිත නිෂ්පාදන නිෂ්පාදනය කිරීම සඳහා පිරිසිදු මුළුතැන්ගෙයි ප්‍රදේශය (ටයිල් සවි කළ මේසය) දිනකට නැවුම් කිරි ලීටර් 25-35ක් ලබා ගැනීමට විශ්වාසදායක ක්‍රමයක් | பால் பொருட்கள் (தயிர், தயிர், நெய், சீஸ்) | ஒரு நாளைக்கு 25-35 லிட்டர் புதிய பால் பெற நம்பகமான வழி. நம்பகமான மின்சாரம் வழங்கல், உபகரணங்களுக்கு பாதுகாப்பான இடம், உணவுப் பொருட்களை சுகாதாரமாக உற்பத்தி செய்ய சுத்தமான சமையலறை பகுதி (டைல் டாப் பெஞ்சுகள்), பயன்படுத்தப்பட்ட எண்ணெயை சுற்றுச்சூழலுக்கு வெளியிடுவதற்கான பாதுகாப்பான பகுதி; |
| Dried Fish production | Availability of fish nearby (e.g. local market), clean area for processing | කරවල නිෂ්පාදනය | අසල මාළු ලබා ගැනීමේ හැකියාව (උදා: දේශීය වෙළඳපොළ), සැකසීම සඳහා පිරිසිදු ප්‍රදේශයක් | கருவாடு உற்பத்தி | அருகில் மீன்கள் கிடைப்பது (எ.கா. உள்ளூர் சந்தை), பதப்படுத்துவதற்கு சுத்தமான பகுதி. |
| Ekle broom and Coir Broom Production | Ability to purchase ekle and coir locally, Easy and reliable way to obtain poles for the broom, Reliable supply of electricity at the production site | කොසු සහ කොහු කොසු නිෂ්පාදනය | දේශීයව එක්ලේ සහ කොහු මිලදී ගැනීමේ හැකියාව, කොස්ස සඳහා කණු ලබා ගැනීමට පහසු සහ විශ්වාසදායක ක්‍රමයක්, නිෂ්පාදන ස්ථානයේ විශ්වාසදායක විදුලි සැපයුමක්. | ஈர்க்கு விளக்குமாறு மற்றும் தென்னை நார் விளக்குமாறு உற்பத்தி | உள்ளூரில் எக்லே மற்றும் தென்னை நார் வாங்கும் திறன், துடைப்பத்திற்கு கம்பங்களைப் பெறுவதற்கான எளிதான மற்றும் நம்பகமான வழி, உற்பத்தி தளத்தில் நம்பகமான மின்சாரம் வழங்கல். |

| | | | | | |
|---|---|---|---|---|---|
| Floor Mats and Mousquito Nets production | Availability of cotton waste materials nearby for making floor mats (for recycling); Reliable supply of electricity; Availability of materials for mosquito nets locally; Skills for producing floor mats and mosquito nets; | බිම් පැදුරු සහ මදුරු දැල් නිෂ්පාදනය | බිම් පැදුරු සෑදීම සඳහා කපු අපද්‍රව්‍ය ළඟම තිබීම (ප්‍රතිචක්‍රීකරණය සඳහා); විශ්වාසදායක විදුලි සැපයුමක්; දේශීයව මදුරු දැල් සඳහා ද්‍රව්‍ය ලබා ගත හැකි වීම; බිම් පැදුරු සහ මදුරු දැල් නිෂ්පාදනය කිරීමේ කුසලතා; | தரை விரிப்புகள் மற்றும் கொசு வலைகள் உற்பத்தி | தரை விரிப்புகள் தயாரிப்பதற்கு (மறுசுழற்சி செய்வதற்கு) அருகிலுள்ள பருத்தி கழிவுப் பொருட்களின் கிடைக்கும் தன்மை; நம்பகமான மின்சாரம்; உள்ளூரில் கொசு வலைகளுக்கான பொருட்கள் கிடைக்கும் தன்மை; தரை விரிப்புகள் மற்றும் கொசு வலைகளை உற்பத்தி செய்வதற்கான திறன்கள்; |
| Goat Farming | ¼ to ½ acre land, Access to veterinery services nearby; Reliable supply of water (either a well or a stream), Ability to collect good fodder; | එළු පාලනය | අක්කර ¼ සිට ½ දක්වා ඉඩමක්, අසල පශු වෛද්‍ය සේවා සඳහා ප්‍රවේශය; විශ්වාසදායක ජල සැපයුමක් (ළිඳක් හෝ ඇළක්), හොඳ ආහාර එකතු කිරීමේ හැකියාව; | ஆடு வளர்ப்பு I | ¼ முதல் ½ ஏக்கர் நிலம், அருகிலுள்ள கால்நடை சேவைகளுக்கான அணுகல்; நம்பகமான நீர் வழங்கல் (கிணறு அல்லது ஓடை), நல்ல தீவனங்களை சேகரிக்கும் திறன்; |
| Groundnut Production | ½ acre land; Reliable supply of water, availability of quality seed; | රටකජු නිෂ්පාදනය | අක්කර භාගයක ඉඩමක්; විශ්වාසදායක ජල සැපයුමක්, ගුණාත්මක බීජ ලබා ගැනීමේ හැකියාව; | நிலக்கடலை உற்பத்தி | ½ ஏக்கர் நிலம்; நம்பகமான நீர் விநியோகம், தரமான விதை கிடைப்பது; |
| Guava Production (Kilo Guvava) | ½ acre land, Reliable supply of water | පේර නිෂ්පාදනය (කිලෝ පේර) | අක්කර ½ ක ඉඩමක්, විශ්වාසදායක ජල සැපයුමක් | கொய்யா உற்பத்தி (கிலோ கொய்யா) | ½ ஏக்கர் நிலம், நம்பகமான நீர் வழங்கல் |
| Inland Fisheries | Availability of tanks or water bodies nearby, which are stocked with fingerlings regularly; Access to boats, fishing gear and nets | මිරිදිය ධීවර කර්මාන්තය | අසල වැංකි හෝ ජල සම්පත් තිබේ. ප්‍රදේශයේ ඇඟිලි පැටවුන් මිලදී ගත හැකිය. බෝට්ටු, ධීවර ආම්පන්න සහ දැල් සඳහා ප්‍රවේශය. | நன்னீர் மீன்வளம் | அருகிலுள்ள தொட்டிகள் அல்லது நீர்நிலைகள் கிடைப்பது, அவை தொடர்ந்து மீன் குஞ்சுகளுடன் சேமித்து வைக்கப்படுகின்றன; படகுகள், மீன்பிடி உபகரணங்கள் மற்றும் வலைகளை அணுகுதல். |
| Mechanized carpentry | Previous knowledge of carpentry work, interest in mechanized carpentery; Access to reliable electricity supply; ¼ acres of land for establishing the workshop; | යාන්ත්‍රික වඩු වැඩ | වඩු වැඩ පිළිබඳ පෙර දැනුම, යාන්ත්‍රික වඩු වැඩ පිළිබඳ උනන්දුව; විශ්වාසදායක විදුලි සැපයුමක් සඳහා ප්‍රවේශය; වැඩමුළුව ස්ථාපිත කිරීම සඳහා අක්කර ¼ ක ඉඩමක්; | இயந்திரமயமாக்கப்பட்ட தச்சு வேலை | தச்சு வேலை பற்றிய முந்தைய அறிவு, இயந்திரமயமாக்கப்பட்ட தச்சு வேலையில் ஆர்வம்; நம்பகமான மின்சார விநியோகத்திற்கான அணுகல்; பட்டறை நிறுவுவதற்கு ¼ ஏக்கர் நிலம்; |
| Moringa Production | ½ acre land, Reliable supply of water | මුරුංගා නිෂ්පාදනය | අක්කර ½ ක ඉඩමක්, විශ්වාසදායක ජල සැපයුමක් | (முருங்கை உற்பத்தி | ½ ஏக்கர் நிலம், நம்பகமான நீர் வழங்கல் |
| Mushroom Cultivation | Vacant area inside the house or shed to do mushroom cultivation, Reliable supply of water | බිම්මල් වගාව | හතු වගාව සඳහා නිවස තුළ හිස් ප්‍රදේශයක් හෝ මඩුවක්, විශ්වාසදායක ජල සැපයුමක්. | காளான் பயிர்ச் செய்கை | காளான் செய்கை மேற்கொள்ளக்கூடிய உள்ளக இட வசதி வீட்டின் ஒரு பகுதி அல்லது ஒரு கொட்டகை, நம்பகமான நீர் வழங்கல் |
| Papaw Production | ½ acre land, Reliable supply of water | පැපොල් නිෂ්පාදනය | අක්කර ½ ක ඉඩමක්, විශ්වාසදායක ජල සැපයුමක් | பப்பாசி உற்பத்தி | ½ ஏக்கர் நிலம், நம்பகமான நீர் வழங்கல் |
| Passion fruit Cultivation | ½ acre land, Reliable supply of water | පැෂන් ෆෘට් වගාව | අක්කර ½ ක ඉඩමක්, විශ්වාසදායක ජල සැපයුමක් | பேஷன் பழ பயிர்ச் செய்கை | ½ ஏக்கர் நிலம், நம்பகமான நீர் வழங்கல் |
| Piggery production (to sell meat and piglets) | ¼ to ½ acre land, Access to veterinery services nearby; Reliable supply of water (either a well or a stream), facility to collect good feed or waste feed in the village areas. | ඌරු මස් නිෂ්පාදනය | අක්කර ¼ සිට ½ දක්වා ඉඩමක්, අසල පශු වෛද්‍ය සේවා සඳහා ප්‍රවේශය; විශ්වාසදායක ජල සැපයුමක් (ළිඳක් හෝ ඇළක්), ගමේ ප්‍රදේශවල හොඳ ආහාර හෝ අපද්‍රව්‍ය එකතු කිරීමේ පහසුකම. | பன்றி வளர்ப்பு | ¼ முதல் ½ ஏக்கர் நிலம், அருகிலுள்ள கால்நடை சேவைகளுக்கான அணுகல்; நம்பகமான நீர் வழங்கல் (கிணறு அல்லது ஓடை), கிராமப் பகுதிகளில் நல்ல தீவனம் அல்லது கழிவு தீவனத்தை சேகரிக்கும் வசதி. |
| Pineapple Production | ½ acre land, Reliable supply of water | අන්නාසි නිෂ්පාදනය | අක්කර ½ ක ඉඩමක්, විශ්වාසදායක ජල සැපයුමක් | அன்னாசி உற்பத்தி | ½ ஏக்கர் நிலம், நீர் |
| Poultry Farming (eggs) | ½ acre land; Access to supply of chicks, feed, vitamins, etc locally, Reliable supply of water and poultry farm buildings; Reliable way to dispose waste | කුකුළු ගොවිතැන (ස්ථර) | අක්කර ½ ක ඉඩමක්; දේශීයව කුකුළු පැටවුන්, ආහාර, විටමින් ආදිය සැපයීමට ප්‍රවේශය, ජලය සහ කුකුළු ගොවිපල ගොඩනැගිලිවල විශ්වාසදායක සැපයුම්; | கோழி வளர்ப்பு (அடுக்குகள்) | ½ ஏக்கர் நிலம்; கோழிக்குஞ்சுகள், தீவனம், வைட்டமின்கள் போன்றவற்றை உள்ளூரில் வழங்குவதற்கான அணுகல், நம்பகமான நீர் மற்றும் கோழி பண்ணை கட்டிடங்களை வழங்குதல்; |

| | | | | | |
|---|---|---|---|---|---|
| Poultry Farming (for meat) | ½ acre land; Access to supply of chicks, feed, vitamins, etc locally, Reliable supply of water and poultry farm buildings; Reliable way to dispose waste | කුකුළු පාලනය(මස් පිණිස) | අක්කර ½ ක ඉඩමක්; කුකුළු පැටවුන්, ආහාර, විටමින් ආදිය දේශීයව සැපයීමට ප්‍රවේශය, විශ්වාසදායක ජල සැපයුමක්, අපද්‍රව්‍ය බැහැර කිරීමට විශ්වාසදායක ක්‍රමයක් | கோழி வளர்ப்பு (இறைச்சிக்காக) | ½ ஏக்கர் நிலம்; குஞ்சுகள், தீவனம், வைட்டமின்கள் போன்றவற்றை உள்ளூரில் பெறுவதற்கான வசதி, நம்பகமான நீர் வழங்கல். |
| Shoes Production | Availability of raw materials for making shoes nearby; Reliable supply of electricity; Availability of materials for mosquito nets nearby towns; Skills for producing floor mats and mosquito nets | සපත්තු නිෂ්පාදනය | සපත්තු සෑදීම සඳහා අමුද්‍රව්‍ය ළඟම තිබීම; විශ්වාසදායක විදුලි සැපයුමක්; අසල නගරවල මදුරු දැල් සඳහා ද්‍රව්‍ය තිබෙන බව; බිම පැදුරු සහ මදුරු දැල් නිෂ්පාදනය කිරීමේ කුසලතා | காலணிகள் உற்பத்தி | காலணிகள் தயாரிப்பதற்கான மூலப்பொருட்கள் அருகிலேயே கிடைப்பது; நம்பகமான மின்சாரம் வழங்கல்; உற்பத்தி செய்வதற்கான திறன்கள். |
| Snacks products | Reliable electricity supply, clean kitchen area (tiled benches) for hygienic snaks products. | ස්නැක්ස් නිෂ්පාදන | විශ්වාසදායක විදුලි සැපයුමක්, සනීපාරක්ෂක ස්නැක්ස් නිෂ්පාදන සඳහා පිරිසිදු මුළුතැන්ගෙයි ප්‍රදේශය (ටයිල් සවි කළ මේසය) | சிற்றுண்டி உற்பத்தி | நம்பகமான மின்சாரம் வழங்கல், உபகரணங்களுக்கு பாதுகாப்பான இடம், உணவுப் பொருட்களை சுகாதாரமாக உற்பத்தி செய்ய சுத்தமான சமையலறை பகுதி (டைல் டாப் பெஞ்சுகள்). |
| String Hoppers/Hoppers Making | Place to prepare hygienecally | ඉදි ආප්ප/ආප්ප සෑදීම | සනීපාරක්ෂකව සකස් කළ යුතු ස්ථානය | இடியாப்பம்/ அப்பம் தயாரித்தல் | சுகாதாரமாக தயாரிக்க வேண்டிய இடம் |
| Sweets Production | Reliable supply of electricity, Safe place for equipment, Clean kitchen area (Tile top benches) to produce Sweet products hygienically; | රසකැවිලි නිෂ්පාදනය | විශ්වාසදායක විදුලි සැපයුමක්, උපකරණ සඳහා ආරක්ෂිත ස්ථානයක්, සෞඛ්‍යාරක්ෂිතව පැණිරස නිෂ්පාදන නිෂ්පාදනය කිරීම සඳහා පිරිසිදු මුළුතැන්ගෙයි ප්‍රදේශය (ටයිල් සවි කළ මේසය); | இனிப்புச் சிற்றுண்டி உற்பத்தி | நம்பகமான மின்சாரம், உபகரணங்களுக்கு பாதுகாப்பான இடம், இனிப்புப் பொருட்களை சுகாதாரமாக உற்பத்தி செய்ய சுத்தமான சமையலறைப் பகுதி (ஓடுகளின் மேல் பெஞ்சுகள்); |

ඇමුණුම 01

**ක්ෂුද්‍ර ව්‍යාපාර මඟින් සවිබල ගැන්වීම සඳහා හඳුනාගත් ප්‍රතිලාභීන් (තෝරා ගන්නා ලද, සමෘද්ධි සහනාධාර ප්‍රතිලාභ ලැබූ, දැනට අස්වැසුම සමාජ ප්‍රතිලාභ නොලබන අඩු ආදායම්ලාභී ප්‍රතිලාභීන් 12 අතරින්) - 2025**

දිස්ත්‍රික්කය .........................................................

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ...................................................

| අ/අ | ග්‍රාම නිලධාරී කොට්ඨාශය | ප්‍රතිලාභියාගේ නම | ජාතික හැඳුනුම්පත් අංකය | දුරකථන අංකය හා වට්ස්ඇප් අංකය | යෝජිත ක්ෂුද්‍ර ව්‍යාපාරය | ප්‍රතිපාදන අවශ්‍යතාවය | | | | මිලදී ගැනීමට අපේක්ෂිත දේ |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | ආයෝජනයට නියමිත මුළු ප්‍රාග්ධනය | අයිතිකරු යෙදවූ ප්‍රාග්ධනය | ප්‍රදානයෙන් අපේක්ෂිත ප්‍රාග්ධනය | බැංකු වෙනත්/අරමුදල් | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |

ඇමුණුම 02 වාාපාරික යෝජනාව

(ව්‍යාපාරයේ නම..........................................................................................................)

## 1.1 විධායක සාරාංශය

1.1.1. ආයෝජනය කර ඇති මුලු ප්‍රාග්ධනය - යෝජිත ප්‍රදානය සමඟ (4.2) ..........................................

a අයිතිකරු යෙදවූ ප්‍රාග්ධනය ..................................

b අපේක්ෂිත ප්‍රාග්ධනය ..................................

1.1.2. මාසයක් සඳහා මුලු මෙහෙයුම් වියදම (4.1)

1.1.3. ලාභදායිත්වය පිළිබඳව ව්‍යාපාරයේ ස්ථාවරත්වය (වාර්ෂික)

a දළ ලාභ අනුපාතය (දළ ලාභය/විකුණුම්)*100

b ශුද්ධ ලාභ අනුපාතය (ශුද්ද ලාභය/විකුණුම්)*100

c හිමිකම මත ප්‍රතිලාභ අනුපාතය (ශුද්ධ ලාභය/යෙදවූ ප්‍රාග්ධනය)*100

## 1.2. ව්‍යවසායකයාගේ මූලික තොරතුරු

1.2.1. ව්‍යාවසායකයාගේ සම්පූර්ණ නම : ..............................................................................
..............................................................................

1.2.2. ස්ථිර ලිපිනය : ..............................................................................
..............................................................................

1.2.3. දිස්ත්‍රික්කය: .............................................. ප්‍රා. ලේ. කොට්ඨාසය ..............................................

1.2.4. ග්‍රාම නිලධාරී කොට්ඨාසය : ..............................................................................

1.2.5. ජා.හැ. අංකය .............................................. 1.2.6. සමෘද්ධි බැංකු ගි. අංකය

1.2.7. දුරකථන අංකය: ..............................................

## 2. ව්‍යාපාරයේ මූලික තොරතුරු

**2.1. ව්‍යාපාරය ක්‍රියාත්මක වන අංශය** a. **කෘෂි** ☐ c. ධීවර
b. **පශු සම්පත්** ☐ d. නිෂ්පාදන

**2.2** ව්‍යාපාරයේ නම (දැනටමත් ව්‍යාපාරයක් ඇත්නම්) ..............................................

2.2.1. ව්‍යාපාරය ලියාපදිංචි කර ඇත්නම් a. අංකය:..................................

2.2.2. එසේ නොවේ නම් ලියාපදිංචිය කරන දිනය: ..............................................

**2.3.** තෝරාගත් ව්‍යාපාරය පිළිබඳව SWOT (ශදුඅත) විශ්ලේෂණය

| ශක්තීන් (ඔබේ ව්‍යාපාරය තුල ඔබේ තරඟකරුවන්ට වැඩි ඔබ සතු ගුණාංග හෝ සම්පත් මොනවාද?) | දුර්වලතා (මෙම ව්‍යාපාරය සාර්ථකකව කරගෙන යාමට වැඩිදියුණු කල යුත්තේ කුමක්ද? (උදා: පුහුණුව, කුසලතාව, සම්පත්) |
|---|---|
| .............................................. | .............................................. |
| .............................................. | .............................................. |
| .............................................. | 9 |
| .............................................. | .............................................. |
| .............................................. | .............................................. |
| .............................................. | .............................................. |
| .............................................. | .............................................. |
| **අවස්ථා** (ඔබට ප්‍රයෝජනයට ගත හැකි ප්‍රවණතා හෝ අවස්ථා මොනවාද?) | **තර්ජන** (ඔබේ ව්‍යාපාරයට ඇති තර්ජන මොනවාද? (උදා: ස්වභාවික විපත්, තරඟකාරිබව, එමගින් ඉල්ලුම අඩුවීම, යටිතල පහසුකම් නොමැතිවීම, විදුලිය, ජලය, පවුලේ ගැටළු, සොර සතුරු උවදුරු, රැකවරනය, වගකීම) |
| .............................................. | |
| .............................................. | .............................................. |
| .............................................. | .............................................. |
| .............................................. | .............................................. |
| .............................................. | .............................................. |
| .............................................. | .............................................. |

**2.4.** මෙම ව්‍යාපාරය තෝරාගැනිමමේ අරමුණු. (*ව්‍යාපාරය ආරම්භ කිරීමේ අපේක්ෂාවන්*)

1 ..............................................................................
2 ..............................................................................
3 ..............................................................................
4 ..............................................................................
5 ..............................................................................

**2.5.** ඔබේ ව්‍යාපාරය මගින් සැපයීමට අපේක්ෂිත භාණ්ඩ හා සේවා තොරතුරු

| භාණ්ඩ හෝ සේවා වර්ගය | භාණ්ඩය හෝ සේවාව පිළිබඳ කෙටි විස්තරයක් |
|---|---|
| | |

**2.6.** මෙම ව්‍යාපාරයේ කටයුතු කරන්නේ කවුද සහ ඔවුන් කරන්නේ කුමක්ද

*(සටහන: අවම වශයෙන් එක සාමාජිකයෙක් හෝ පූර්ණකාලීනව මෙම ව්‍යාපාරයේ කටයුතු සිදු කල යුතුයි)*

| අංක | කටයුතු කරන්නේ කවුද | ව්‍යාපාරික කටයුත්තේ ස්වභාවය |
|---|---|---|
| | | |
| | | |
| | | |

**2.7.** දැනටමත් ඔබ සතු භෞතික හා මූල්‍ය සම්පත්:

(උදා: ඉඩම්, ගොඩනැගිලි, යන්ත්‍රසූත්‍ර හා මෙවලම්, අමුද්‍රව්‍ය, වෙළඳ තොගය, ලැබීමට හා ගෙවීමට ඇති දෑ)

| අංක | සම්පත්වල ස්වරූපය | සියලු වත්කම් (රු) |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | අයිතිකරු යෙදවූ ප්‍රාග්ධනය | |
| | | |

**2.8.** මිලදී ගැනීමට යෝජිත සම්පත්

| a. මිලදී ගැනීමට අපේක්ෂිත දේ | b. සවිබල ගැන්වීමේ ප්‍රදානය යොදවන මුදල (රු) | c. තමන් යොදවන මුදල (රු) |
|---|---|---|
| | | |
| | | |
| | | |
| එකතුව | | |

**3** අලෙවි සැලසුම

**3.1** ඔබේ ගැනුම්කරුවන් හා විකුණුම් පිළිබඳ තොරතුරු - (මාසික)

ඔබේ ගැනුම්කරුවන් පිළිබඳ කෙටි විස්තරයක් ........................................................................................

| භාණ්ඩය/සේවාවේ නම | විකුණුම් ප්‍රමාණය | ඒකක මිල රු. |
|---|---|---|
| | | |
| | | |
| එකතුව රු. | | |

3.2 ඔබ ඔබේ භාණ්ඩය හෝ සේවාව ඔබේ තරඟකරුවන්ට වඩා ආකර්ශනීය ලෙස ඉදිරිපත් කරන්නේ කෙසේද?:

| නිෂ්පාදිත භාණ්ඩය හෝ සේවාව | මිල නියම කිරීම සම්බන්ධව | බෙදාහැරීමේ ක්‍රමය සම්බන්ධව |
|---|---|---|
| | | |

## 4 මූල්‍ය සැලැස්ම හා මූල්‍යකරණය

(සැලකිය යුතුයි: ව්‍යාපාරය මාසයක් පවත්වාගෙන යෑම සඳහා දැරිය යුතු සියලු වියදම් අදාල කොටසේ සටහන් කරන්න. නිෂ්පාදිත හෝ සේවා එකකට මෙම පිරිවැය ගණනය කිරීම එකක් බැගින් සම්පූර්ණ කළ යුතු වේ)

### 4.1 මුළු මාසික පිරිවැය

| අංක | වියදම් විස්තරය | ඒකක ගණන |
|---|---|---|
| | <u>විචල්‍ය පිරිවැය වර්ග</u> | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | මුලු විචල්‍ය පිරිවැය එකතුව | |
| | <u>ස්ථාවර පිරිවැය වර්ග</u> | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | මුලු ස්ථාවර පිරිවැය එකතුව | |
| | පිරිවැය විශ්ලේෂණය | |
| | මුලු විචල්‍ය පිරිවැය | |
| | මුලු ස්ථාවර පිරිවැය | |
| | මුලු මාසික පිරිවැය (මෙහෙයුම්) | |
| | ඒකකයක විකුණුම් මිල | |
| | <u>අඩු:</u> ඒකකයක විචල්‍ය පිරිවැය | |
| | ඒකකයක දායකත්වය | |
| | ලාභ/පාඩු නොලබන තත්වයේ දි නිපදවිය යුතු හෝ අලෙවිකළ යුතු ඒකක ප්‍රමාණය | |

### 4.2 අරමුදල් ප්‍රභවය

| අංක | මූලාශ්‍රය (උදා:ඉතුරුම්, ප්‍රදාන වැඩසටහන් ආධාර, ණය ආදිය) |
|---|---|
| 1 | දැනටමත් ව්‍යාපාරයට මුදල් යොදවා ඇති ආකාරය (2.7 හි එකතුව) |
| | 1. ව්‍යාවසායකයාගේ මුදල් වශයෙන් යොදවා ඇති (2.7 හි අයිතිකරු ප්‍රාග්ධනය) |
| | 2. ව්‍යවසායකයා ණය ලෙස ලබාගෙන යොදවා ඇති (2.7 හි ණය) |
| 2 | සවිබල ගැන්වීමේ වැඩසටහනෙන් ලැබෙන ප්‍රධානයන් (2.8 හි b) |
| 3 | ව්‍යවසායකයා පෞද්ගලිකව යෙදවීමට අපේක්ෂිත මුදල (2.8 හි c) |
| 4 | තවදුරටත් ලබා ගැනීමට අපේක්ෂිත ණය මුදල් (2.8 හි d) |
| | ව්‍යාපෘතියේ මුලු ආයෝජනය |

4.3 ලාභාලාභ පුරෝකථනය

| විස්තරය | මාසික | පළමු වර්ෂය |
|---|---|---|
| අපේක්ෂිත විකුණුම් (3.1) | | |
| අඩුකළා: | | |
| අපේක්ෂිත වියදම (විචල්‍ය වියදම) (41) | - | |
| අපේක්ෂිත දළ ලාභය/අලාභය (ආයකත්වය) | - | |
| අඩුකළා: | | |
| මුලු ස්ථාවර වියදම් (4.1) | | |
| අපේක්ෂිත ශුද්ධ ලාභය/අලාභය | | |

4.4. මෙම ව්‍යාපාර යෝජනාවේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් මා වෙත නියමිත ප්‍රධානයන් නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙසත් ඉල්ලා සිටිමි.

.............................................................. ..........................................

ඉල්ලුම් කරුගේ නම අත්සන

5 අනුමැතිය

| අංක | නම | තනතුර | කාර්යය | අත්සන |
|---|---|---|---|---|
| 1 | | සමෘද්ධි සංවර්ධන නිලධාරී | ඉදිරිපත් කර ඇති තොරතුරු සත්‍ය බව. | |
| 2 | | පුහුණු කළමණාකරු | ව්‍යාපාර සැලැස්ම සැකසීම | |
| 3 | | කළාප කළමණාකරු | නිර්දේශ කර ඉදිරිපත් කිරීම | |
| 4 | | ව්‍යාපෘති කළමණාකරු | නිර්දේශ කර තාක්ෂණ නිලධාරීට ඉදිරිපත් කිරීම | |
| 5 | | තාක්ෂණික නිලධාරී | තාක්ෂණික අනුමැතිය ලාබාදීම | |
| 6 | | බැංකු සමිති කළමණාකරු | නිර්දේශ කර ඉදිරිපත් කිරීම | |
| 7 | | ප්‍රාදේශීය ලේකම් | නිර්දේශය (නිල මුද්‍රාව) | |
| 8 | | දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල් දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ | නිර්දේශය (නිල මුද්‍රාව) | |

## ප්‍රජා ප්‍රජා සවිබලගැන්වීම වැඩසටහන-2025

### භාණ්ඩාගාර ප්‍රතිපාදන මත ජීවනෝපාය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

| අනු | දිස්ත්‍රික්කය | ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය | ප්‍රා.ලේ. කො. සංඛ්‍යාව | ග්‍රා . නිළ.වස. සංඛ්‍යාව | බාණ්ඩය | | එකතුව | වසමකට 15 බැගින් ව්‍යාපෘති | ව්‍යාපෘති ලබාදීමට |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | දුප්පත් | අන්ත දුප්පත් | | | |
| 1 | කොළඹ | කොලොන්නාව | 1 | 46 | 727 | 200 | 927 | 690 | 399 |
| 2 | | කොළඹ | 1 | 35 | 2485 | 524 | 3,009 | 525 | 304 |
| 3 | ගම්පහ | මීගමුව | 1 | 39 | 1383 | 325 | 1,708 | 585 | 338 |
| 4 | කළුතර | පානදුර | 1 | 72 | 2339 | 700 | 3,039 | 1,080 | 623 |
| 5 | ගාල්ල | බෙන් | 1 | 51 | 1380 | 400 | 1,780 | 765 | 443 |
| 6 | මාතර | පිටබැද්දර | 1 | 40 | 1124 | 637 | 1,761 | 600 | 347 |
| 7 | හම්බන්තොට | සූරියවැව | 1 | 21 | 1233 | 179 | 1,412 | 315 | 183 |
| 8 | රත්නපුර | ඇහැලියගොඩ | 1 | 44 | 2692 | 955 | 3,647 | 660 | 382 |
| 9 | කෑගල්ල | රඹුක්කන | 1 | 89 | 4003 | 1,247 | 5,250 | 1,335 | 770 |
| 10 | කුරුණෑගල | ගිරිබාව | 1 | 35 | 946 | 198 | 1,144 | 525 | 303 |
| 11 | පුත්තලම | කල්පිටිය | 1 | 31 | 2264 | 492 | 2,756 | 465 | 269 |
| 12 | මහනුවර | තුන්පනේ | 1 | 67 | 628 | 194 | 822 | 1,005 | 581 |
| 13 | මාතලේ | ගලේවෙල | 1 | 59 | 2483 | 730 | 3,213 | 885 | 511 |
| 14 | නුවරඑළිය | කොත්මලේ | 1 | 96 | 5172 | 2,689 | 7,861 | 1,440 | 830 |
| 15 | බදුල්ල | මයිංගනය | 1 | 35 | 5320 | 1,502 | 6,822 | 525 | 304 |
| 16 | මොණරාගල | බිබිල | 1 | 40 | 1459 | 636 | 2,095 | 600 | 347 |
| 17 | අම්පාර | දෙහිඅත්තකණ්ඩි ය | 1 | 13 | 1646 | 399 | 2,045 | 195 | 113 |
| 18 | අනුරාධපුරය | පදවිය | 1 | 15 | 432 | 99 | 531 | 225 | 131 |
| 19 | පොලොන්නරු ව | හිඟුරක්ගොඩ | 1 | 53 | 3507 | 994 | 4,501 | 795 | 458 |
| 20 | යාපනය | කයිට්ස් | 1 | 15 | 493 | 245 | 738 | 225 | 130 |
| 21 | වව්නියාව | වව්නියාව උතුර | 1 | 20 | 421 | 189 | 610 | 300 | 174 |
| 22 | මන්නාරම | මන්නාරම නගරය | 1 | 49 | 1353 | 126 | 1,479 | 735 | 423 |
| 23 | කිලිනොච්චිය | පච්චිලායිපිලෙයි | 1 | 18 | 925 | 303 | 1,228 | 270 | 157 |
| 24 | මඩකලපුව | වව්නියාව උතුර | 1 | 16 | 2316 | 791 | 3,107 | 240 | 139 |
| 25 | ත්‍රිකුණාමලය | පදවි ශ්‍රීපුර | 1 | 10 | 119 | 21 | 140 | 150 | 87 |
| 26 | මුලතිව් | තුන්නක්කායි | 1 | 20 | 441 | 306 | 747 | 300 | 174 |
| | | | | **1,029** | **47,291** | **15,081** | **62,372** | 15,435 | 8,920 |

# ප්‍රජා ප්‍රජා සවිබලගැන්වීම වැඩසටහන - 2025

## දිස්ත්‍රික් මට්ටමින් ප්‍රතිපාදනවෙන් කිරීම (භාණ්ඩාගාර ප්‍රතිපාදන )

| අංකය | දිස්ත්‍රික්කය | ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය | ප්‍රතිපාදන ලබාදෙන පවුල් සංඛ්‍යාව | වෙන්වන මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රු:- | දිස්ත්‍රික් පරිපාලන වියදම 0.5% | ප්‍රා. ලේ පරිපාලන වියදම 1% | දිස්ත්‍රික්කය සඳහා වෙන්වන මුදල රු:- |
|---|---|---|---|---|---|---|---|
| 1 | කොළඹ | කොලොන්නාව | 399 | 19,950,000.00 | 99,750.00 | 199,500.00 | 20,249,250.00 |
| 2 | | කොළඹ | 304 | 15,200,000.00 | 76,000.00 | 152,000.00 | 15,428,000.00 |
| 3 | ගම්පහ | මීගමුව | 338 | 16,900,000.00 | 84,500.00 | 169,000.00 | 17,153,500.00 |
| 4 | කළුතර | පානදුර | 623 | 31,150,000.00 | 155,750.00 | 311,500.00 | 31,617,250.00 |
| 5 | ගාල්ල | බෙන් | 443 | 22,150,000.00 | 110,750.00 | 221,500.00 | 22,482,250.00 |
| 6 | මාතර | පිටබැද්දර | 347 | 17,350,000.00 | 86,750.00 | 173,500.00 | 17,610,250.00 |
| 7 | හම්බන්තොට | සූරියවැව | 183 | 9,150,000.00 | 45,750.00 | 91,500.00 | 9,287,250.00 |
| 8 | රත්නපුර | සූරියවැව | 382 | 19,100,000.00 | 95,500.00 | 191,000.00 | 19,386,500.00 |
| 9 | කෑගල්ල | රඹුක්කන | 770 | 38,500,000.00 | 192,500.00 | 385,000.00 | 39,077,500.00 |
| 10 | කුරුණෑගල | ගිරිබාව | 303 | 15,150,000.00 | 75,750.00 | 151,500.00 | 15,377,250.00 |
| 11 | පුත්තලම | කල්පිටිය | 269 | 13,450,000.00 | 67,250.00 | 134,500.00 | 13,651,750.00 |
| 12 | මහනුවර | තුන්පනේ | 581 | 29,050,000.00 | 145,250.00 | 290,500.00 | 29,485,750.00 |
| 13 | මාතලේ | ගලේවෙල | 511 | 25,550,000.00 | 127,750.00 | 255,500.00 | 25,933,250.00 |
| 14 | නුවරඑළිය | කොත්මලේ | 830 | 41,500,000.00 | 207,500.00 | 415,000.00 | 42,122,500.00 |
| 15 | බදුල්ල | මයංගනය | 304 | 15,200,000.00 | 76,000.00 | 152,000.00 | 15,428,000.00 |
| 16 | මොණරාගල | බිබිල | 347 | 17,350,000.00 | 86,750.00 | 173,500.00 | 17,610,250.00 |
| 17 | අම්පාර | දෙහිඅත්තකණ්ඩිය | 113 | 5,650,000.00 | 28,250.00 | 56,500.00 | 5,734,750.00 |
| 18 | අනුරාධපුරය | පදවිය | 131 | 6,550,000.00 | 32,750.00 | 65,500.00 | 6,648,250.00 |
| 19 | පොලොන්නරුව | හිඟුරක්ගොඩ | 458 | 22,900,000.00 | 114,500.00 | 229,000.00 | 23,243,500.00 |
| 20 | යාපනය | කයිට්ස් | 130 | 6,500,000.00 | 32,500.00 | 65,000.00 | 6,597,500.00 |
| 21 | වව්නියාව | වව්නියාව උතුර | 174 | 8,700,000.00 | 43,500.00 | 87,000.00 | 8,830,500.00 |
| 22 | මන්නාරම | මන්නාරම නගරය | 423 | 21,150,000.00 | 105,750.00 | 211,500.00 | 21,467,250.00 |
| 23 | කිලිනොච්චිය | පච්චිලායිපිලෙයි | 157 | 7,850,000.00 | 39,250.00 | 78,500.00 | 7,967,750.00 |
| 24 | මඩකලපුව | වව්නියාව උතුර | 139 | 6,950,000.00 | 34,750.00 | 69,500.00 | 7,054,250.00 |
| 25 | ත්‍රිකුණාමලය | පදවි ශ්‍රීපුර | 87 | 4,350,000.00 | 21,750.00 | 43,500.00 | 4,415,250.00 |
| 26 | මුලතිව් | තුන්නක්කායි | 174 | 8,700,000.00 | 43,500.00 | 87,000.00 | 8,830,500.00 |
| | | | 8,920 | 446,000,000.00 | 2,230,000.00 | 4,460,000.00 | 452,690,000.00 |

ඇමුණුම 5

ඇමුණු

# ප්‍රජා සවිබලගැන්වීමේ වැඩසටහන 2025

## අස්වැසුම ප්‍රතිලාභින් සඳහා ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය:-

ග්‍රාම නිළධාරි :-

| අංකය | ප්‍රතිලාභියාගේ නම | ලිපිනය | අස්වැසුම ගෘහ අංකය | අයත් බාණ්ඩය | | ව්‍යාපෘතිය | ව්‍යාපෘති පිරිවැය | | ව්‍යාපෘතියේ මුළු පිරිවැය රු:- |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | දුප්පත් | අන්ත දුප්පත් | | ප්‍රතිලාභි දායකත්වය රු:- | රජයේ දායකත්වය රු:- | |
| 1 | | | | | | | | | |
| 2 | | | | | | | | | |
| 3 | | | | | | | | | |
| 4 | | | | | | | | | |
| 5 | | | | | | | | | |
| 6 | | | | | | | | | |
| 7 | | | | | | | | | |
| 8 | | | | | | | | | |
| 9 | | | | | | | | | |
| 10 | | | | | | | | | |
| 11 | | | | | | | | | |

සකස් කළේ :- සමෘද්ධි සංවර්ධන නිළධාරි
නම:-
අත්සන :-

පරික්ෂා කළේ :- ව්‍යාපෘති කළමනාකරු
නම :-
අත්සන :-

අනුමත කළේ :- ප්‍රාදේශිය ලේකම්
නම :-
අත්සන :-

ඇමුණුම 06

| කාර්යාල ප්‍රයෝජනය සඳහා | |
|---|---|
| ගිවිසුම් පත් අංක | |

## ප්‍රජා සවිබල ගැන්වීමේ වැඩසටහන යටතේ අස්වැසුමලාභින් සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමේදි සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව හා ව්‍යාපෘතිලාභියා අතර එළඹෙනු ලබන ගිවිසුම

මෙහි පළමු පාර්ශවය යයි කියනු ලබන ශ්‍රිලංකා ප්‍රජාතන්ත්‍රවාදි සමාජවාදි ජනරජයේ 2017 අංක 2 දරන පනතින් සංශෝධිත 2013 අංක 01 දරණ දිවි නැගුම පනත මගින් ස්ථාපිත කරණ ලද 4 වන මහල, සෙත්සිරිපාය , බත්තරමුල්ල යන ස්ථානයෙහි පිහිටි සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙනුවෙන් ............................ දිස්ත්‍රික්කයෙහි .................. ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශිය ලේකම් හෝ ඔහු විසින් බලය පවරනු ලබන සමෘද්ධි කළමනාකරු එක් පාර්ශවයකට ද,

දෙවන පාර්ශවයැයි කියනු ලබන එම බල ප්‍රෙද්ශයේ ................................................ ( ස්ථිර ලිපිනය ) හි පදිංචි ජා.හැ.ප. අංක ........................................ දරණ ( සම්පූර්ණ නම )මයා / මිය /මෙනවිය යන අය හා ( මින් මතු ව්‍යාපෘතිලාභියෙකු වශයෙන් හඳුන්වනු ලබන ) අනෙක් පාර්ශවයටද බැදි දෙපාර්ශවයේ එකගත්වය ඇතිව වර්ෂ 20................. ක් වූ ..................... මස ............ වෙනි දින ඇති කර ගන්නා ලද ගිවිසුමයි.

**එකි ගිවිසුමෙහි කොන්දේසි කවරේද යත්,**

1. ඉහත ගිවිසුම් ප්‍රකාරව ජිවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ ආදායම් උත්පාදන කටයුතු ප්‍රවර්ධනය කිරිම පිණිස හඳුනා ගන්නා ලද ( ව්‍යාපෘතියේ නම ).................................. සඳහා එකි ව්‍යාපෘතිලාභියා සුදුසු වන හෙයින් පහත දක්වා ඇති ව්‍යාපෘති යෙදවුම් මතු දැක්වෙන කොන්දේසි වලට යටත්ව භාරදිමට දෙපාර්ශවය එකගවේ.

2. ඉහත ගිවිසුම් ප්‍රකිරව සමෘද්ධි වැඩසටහන යටතේ උක්ත ව්‍යාපෘති ආරම්භ කිරිම වෙනුවෙන් පහත ලේඛනයේ සඳහන් රුපියල් .............................. ක් ( රු.................. ) වටිනා ව්‍යාපෘති / යෙදවුම් අද දින ව්‍යාපෘති ලාභියා වෙත භාරදුන් බවට දෙපාර්ශවයම එකග වේ.

3. ඉහත ගිවිසුම් ප්‍රකාරව ලබා දෙන ලද වගා ව්‍යාපෘතිය / ............................ව්‍යාපෘතිය අඛණ්ඩ ගෙන යන බවට දෙපාර්ශවය එකගවේ.

4. ඉහත ගිවිසුම් ප්‍රකාරව ලබා ගත් එකි යෙදවුම් මෙම ව්‍යාපාතිය සඳහා පමණක් නිසි ලෙස යොදා ගනිමින් ව්‍යාපෘතිය සාර්ථකව පවත්වා ගෙන යාමට දෙවන පාර්ශවය බැදි සිටි.

5. ඉහත ගිවිසුම් ප්‍රකාරව ව්‍යාපාති ක්‍රියාත්මක කිරිමේදි ස්වභාවික හානියක් හැර, නොසැලකිලිමත් කම නිසා ව්‍යාපෘතිට හානියක් සිදු විමෙන් ව්‍යාපෘතිය අසාර්ථක වුවහොත් රජය විසින් දරණ ලද මුළු මුදල දෙවන පාර්ශවය විසින් පළමු පාර්ශවයට ගෙවිමට බැදි සිටි.

6. ඉහත ගිවිසුම් ප්‍රකාරව ආරම්භ කරන ලද ව්‍යාපෘතිය යම් හේතුවක් නිසා හානියට පත් වුවහොත් වහාම ඒ බව වහාවම ඒ බව වසමේ සමෘද්ධි සංවර්ධන නිලධාරි හෝ ( ව්‍යාපෘති / මුලස්ථාන ) කළමනාකරු වෙත සිද්ධිය සිදුවි පැය 24 ක් ඇතුලත කරන බවට දෙවන පාර්ශවය එකගවේ.

7. ඉහත ගිවිසුම් ප්‍රකාරව ව්‍යාපෘතිය අධික්ෂණය හා පසු විපරම් කිරීම සමෘද්ධි සංවර්ධන නිලධාරියාට / ව්‍යාපෘති කළමනාකරුට හා අදාල අනෙකුත් සහාය සේවා සපයන නිලධාරීන්ටත් ඇති බව දෙපාර්ශවය පිළිගනී.

8. මෙම ගිවිසුම අනුව ව්‍යාපෘතිය සම්බන්ධ ඉහත කොන්දේසි උල්ලංඝනය කිරීමෙන් හෝ කඩකිරීමෙන් මෙම දෙපාර්ශවය අතර ඇතිවන ආරවුල් හෝ ගැටළු සහගත තත්වයකදී අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තීරණය අවසාන තීරණය බව දෙපාර්ශවය පිළිගනී.

මීට සාක්ෂි වශයෙන් පළමු පාර්ශවය සඳහා සමෘද්ධි දෙපාර්තමේන්තුව වෙනුවෙන් ............ ප්‍රාදේශීය ලේකම් හෝ බලය පවරන ලබන සමෘද්ධි කලමනාකරු සහ දෙවන පාර්හවය වෙනුනේ ව්‍යාපෘතිලාභියා වර්ෂ.......... ක් වූ .... මස .... වනි දින ............................ හිදී අත්සන් තබන ලදී.

| | |
|---|---|
| පළමු පාර්ශවය | දෙවන පාර්ශවය |
| අත්සන ........................... | අත්සන ................... |
| මුලස්ථාන / ව්‍යාපෘති කළමනාකරු | ව්යාපෘතිලාභියා |
| (නිල මුද්‍රාව ) | ජා. හැ. ප. අංකය. .......................... |
| දිනය : | දිනය : |

| | |
|---|---|
| පළමු පාර්ශවය වෙනුවෙන් අත්සනට සාක්ෂි | පළමු පාර්ශවය වෙනුවෙන් අත්සනට සාක්ෂි |
| 1. අත්සන : | 2. අත්සන : |
| නම: | නම : |
| ජා. හැ. ප. අංකය : | ජා. හැ .ප. අංකය: |